**මාතර මහා නගර සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

මාතර මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට මාතර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අභිතකර මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර  සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව නොතිබුණි.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා දායක විශ්‍රාම වැටුප් අරමුදලට  ගෙවිය යුතු රු.48,734,760 ක  මුදල වෙනුවෙන් ණයගිම් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සැපයුම්කරුවන්ගෙන් ලබා ගෙන නොතිබූ විදුලි ජනක යන්ත්‍රයක් වෙනුවෙන් රු.5,000,000 ක විවිධ ණයහිමි ප්‍රතිපාදන සලස්වා තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු කුලී ආදායම් ශේෂය රු.70,953,172 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ආදායම් ශීර්ෂ 04 කින් ලැබිය යුතු රු. 5,674,588 ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | ඉකුත් වර්ෂවලට අදාළව සමාලෝචිත වර්ෂයේදී ආදායම් ශීර්ෂ 02 කින් ලැබී තිබූ රු.889,239 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | කසල බදු ආදායම්-පාලන ගිණුමක් නොමැති බැවින් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ශුද්ධ ආදායම රු. 5,471,640 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු උසාවි දඩ රු.461,248 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.462,528 ක විවිධ වියදම් සඳහා විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගමන් වියදම්, හිඟ අතිකාල දීමනා, පුවත්පත් බිල්පත් හා එලදා බද්ද හැර ඉතිරි අයිතම සඳහා ණය හිමි ප්‍රතිපාදන ඇති කර තිබෙන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට අතැති තොග ශුද්ධ ශේෂය රු.13,531,056 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඌ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් 1995 වර්ෂයේදී නගර සභාව වෙත ලබා දී තිබූ රු.89,374,000 ක ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ණය මුදල හා පොලිය රු.99,052,161 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අදාළ පාර්ශවයන් විසින් නිශ්චිත පිළිතුරක් ලබා නොදීම නිසා මෙම මුදල ගිණුම්ගත නොකළ බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව විසින් විවිධ සැපයුම් හා සේවා ලබා ගැනීමේදී ගෙවන ලද රු.3,096,925 ක වැට් බදු හා රැස්කරන ලද රු.2,582,737 ක වැට් බදු ගැලපීමෙන් පසු රු.514,188 ක් වූ ශේෂය | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබූ අතර රු.2,582,737 ක් වූ රැස්කළ වැට් බදු පොදු තැන්පතු යටතේ ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඒ) | සමාලෝචිත වර්ෂය තුලදී ගබඩා ණයහිමියන් වෙත කරන ලද රු.4,397,111 ක් වූ ගෙවීම් ගබඩා ණයහිමි ගිණුමට හර නොකර ගබඩා අත්තිකාරම් ගිණුමට හර කිරීම නිසා ගබඩා ණයහිමි ශේෂය හා ගබඩා අත්තිකාරම් ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය අවසානයට මාසික වියදම් සාරාංශයෙහි ඇතුළත් වූ වියදම් විෂයයන් 02 කට අදාළව රු.2,795,571 ක් වැඩියෙන්ද වියදම් විෂයයන් 03 කට අදාලව රු.3,992,542 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | වියදම් විශ්ලේෂණය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රජා සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ වැඩසටහන් 02 ක් වෙනුවෙන් අයවැය මගින් වෙන් කර තිබූ ප්‍රතිපාදනවලින් ඉතිරි වූ රු.123,579 ක් විවිධ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ක) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවීම් අවසන් කර තිබූ රු. 1,126,923 ක කර්මාන්ත ණයහිමි ශේෂ 11 ක් කර්මාන්ත ණයහිමි යටතේ තවදුරටත් දැක්වීම නිසා කර්මාන්ත ණයහිමි ශේෂය එම වටිනාකමින් වැඩිපුර දක්වා තිබුණි. | ඉදිරියේදී මෙම ශේෂ ණයහිමි ලේඛණයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ග) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් කර්මාන්ත 07 කට ගෙවිය යුතු රු.665,206 ක් වෙනුවෙන් කර්මාන්ත ණයහිමි යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | එම කර්මාන්ත ඉදිරියේදී ලේඛණයට ඇතුලත් කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ජ) | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු.1,037,612 ක් වටිනා ඉන්වෙන්ට්‍රි හා පාරිභෝජන ස්වරූපයේ භාණ්ඩ අයිතම 1474 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ට) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් ණයහිමි ශේෂයේ ශුද්ධ වටිනාකම රු. 7,040,291 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | ඇස්තමේන්තු මුදල මත ණයහිමි ප්‍රතිපාදන ඇති කිරීම නිසා ණයහිමි ශේෂය වෙනස් විය හැකි බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඩ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කර්මාන්ත ණයගැති ශේෂය රු.5,353,403 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ණයගැති ශේෂ 04 ක් සඳහා ලැබී තිබූ රු.1,683,220 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ත) | සභාව විසින් බැංකු 03 ක පවත්වා ගෙන ගොස් තිබූ ස්ථාවර තැන්පතු 38 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු පොලිය රු.1,660,947 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ලැබී ඇති රු.21,247,120 ක මුදල හා 2022 වර්ෂයට ලැබිය යුතු රු.20,562,772 ක පොළී මුදල ගිණුම්ගත කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වූ රු. 496,572,529 ක් වූ ගිණුම් විෂයන් 09 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගි ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.10,186,555 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.568,364,209 ක් වූ ගිණුම් විෂයයන් 19 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**1.7.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

මුදල් රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| (අ) | | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | (i) | මු.රෙ.104 (3) සහ මු.රෙ.104 (4) | සභාව සතු ඩීමෝ බට්ටා රථයට සමාලෝචිත වර්ෂයේදී සිදු වූ අනතුරට අදාළව 2023 මැයි 02 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විගණනයට ඉදිරිපත් කර නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| | | මු.රෙ.103(4) | මාතර මහා නගර සභාවේ ගිනි නිවන ඒකකය සතු ආපදා මැදිහත්වීමේ රථයේ රියදුරු | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ලෙස සේවය කළ එක්තරා ගිනිභටයෙකු විසින් එන්ජිමෙහි උෂ්ණත්වය පිළිබඳව අනවධානයෙන් ධාවනය කිරීම නිසා සිදු වූ හානිය සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2023 මැයි 02 දින වන විටත් පරීක්ෂණ පවත්වා, අලාභයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීමට කටයුතු කර නොතිබූ අතර උක්ත රථයේ අලුත්වැඩියා කටයුතු නොකර පෞද්ගලික ගරාජයක ගාල් කර තිබුණි. | | |
| (ii) | මු.රෙ. 371 (5) | නිලධාරින් තිදෙනෙකු විසින් අවස්ථා 06 කදී ලබාගත් රු.63,636 ක අත්තිකාරම් පියවීමට දින 05 සිට දින 28 ක කාල ප්‍රමාදයක් පැවතුණි. | විෂය නිලධාරීන් වෙත අවවාද ලිපි, උපදෙස් ලිපි නිකුත් කර ඇති බවත්, ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | මු.රෙ. 571 | 2000 වර්ෂයේ සිට තැන්පත් කරන ලද එකතුව රු.6,964,085 ක් වූ විවිධ තැන්පතු ශේෂ 5,152 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ එකතුව රු.2,522,241 ක් වූ අත්තිකාරම් ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පියවා නොතිබුණි. | අවසාන බිල්පත ඉදිරිපත්වී නොමැති බැවින් අත්තිකාරම් පියවා නොමැති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.162,479,763 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.142,443,317 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 36,726,576 | 42,135,018 | 36,096,681 | 67,044,179 | 39,098,558 | 35,760,433 | 30,146,775 | 61,005,842 |
| කුලී | 28,469,950 | 29,152,465 | 13,395,072 | 90,579,394 | 35,092,100 | 29,446,071 | 18,380,835 | 74,822,001 |
| බලපත්‍ර ගාස්තු | 25,241,000 | 23,045,801 | 36,629,472 | 11,790,957 | 31,591,000 | 18,679,858 | 15,276,037 | 25,374,628 |
| වෙනත් ආදායම් | 66,224,500 | 91,570,343 | 67,246,462 | 34,097,341 | 73,701,900 | 115,931,070 | 337,320,029 | 9,773,460 |
| එකතුව | 156,662,026 | 185,903,627 | 153,367,687 | 203,511,871 | 483,558,179 | 199,817,432 | 401,123,676 | 170,975,931 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.60,689,595 ක් වූ අතර වරිපනම් ඒකක 34606 කට අදාළව වර්ෂය තුළදී බිල් කිරීම් රු.34,082,159 ක් සමඟ රු.94,771,754 ක් අය විය යුතුව තිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | සභාව සතු කඩ කාමර 607 න් 594 ක් බදු දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් බදුකරුවන් 433 දෙනෙකුගෙන් රු.22,556,363 ක කඩ කුලී අයවීමට තිබුණි. හිඟ ශේෂ පැවති කඩ කාමරවලින් කඩ කාමර 330 කට අදාළව රු.25,000 ට වැඩි හිඟ ශේෂ පැවති අතර එය මුළු කඩ කාමර සංඛ්‍යාවෙන් සියයට 76 ක ප්‍රතිශතයක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/පපාකො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව සභාව සතු වෙළෙඳ සංකීර්ණ 04 කට අයත් කඩ කාමර 30 කට කඩ කාමර බදු දීමේදී අය කළ යුතු එක්වන් මුදල වූ රු.6,752,755 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඈ) | මහා නගර සභාවට අයත් ස්ථාන 02 ක තිබෙන කඩ කාමර 56 ක් ලිඛිත ගිවිසුමකින් තොරව බදු දී තිබුණි. | අදහස් දක්වා නොමැත | ලිඛිත ගිවිසුමකට එළඹ බදු දීම කළයුතුය. |
| (ඉ) | සභාව සතු කඩ කාමර 86 කට අදාළව බදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණු අතර ඒවායේ ගිවිසුම් කාලය ඉකුත් වීමෙන් පසුව නැවත ගිවිසුම් යාවත්කාලීන කිරීම ප්‍රමාද කර තිබූ කාල සීමාව මාස 01 ත් වර්ෂ 21 යි මාස 08 ත් අතර පරාසයක විය. | කඩ කාමර 06 ක ගිවිසුම් මේ වනවිට යාවත්කාලීන කරන ලද බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඊ) | සභාව සතු කොටුවේගොඩ නව වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 66 න් 49 ක් හා කොටුවේගොඩ වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 20 ක් බදුකරුවන් විසින් ව්‍යාපාර කටයුතු සඳහා භාවිතයට නොගෙන වසා දමා තිබුණ අතර කොටුවේගොඩ නව වෙළෙඳ සංකීර්ණයේ වසා දමා තිබූ කඩ කාමර 49 න් කඩ කාමර 35 කට අදාළව බදුකරුවන් සමඟ බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | සියළු ගිවිසුම් යාවත්කාලීන කර, ගිවිසුම් අනුව කටයුතු කළයුතුය. |
| (උ) | කොටුවේගොඩ පැරණි වෙළෙඳ සංකීර්ණයේ බදුකරුවන් 14 දෙනෙකු හා කොටුවේගොඩ නව වෙළෙඳ සංකීර්ණයේ බදුකරුවන් 13 දෙනෙකු සභාවේ අනුමැතියකින් තොරව කඩ කාමර වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදු දී තිබුණි. | අදහස් දක්වා නොමැත. | ගිවිසුම් අනුව කටයුතු කළයුතුය. |
| (ඌ) | මාතර මහා නගර සභාවට අයත් මාතර තානායම කළමනාකරණය කර පවත්වා ගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් උප සමාගමක් වන පෞද්ගලික ආයතනයක් වෙත පවරා තිබූ අතර, එම ආයතනය විසින් උපයන කළමනාකරණ ගාස්තු මත බිල් කළ ආදායමෙන් 2019 ඔක්තෝබර් සිට 2022 ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව අය විය යුතු රු. 2,152,266 ක මුදලක් අය කර ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නීති නිලධාරී මගින් එන්තරවාසි යවා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (එ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.488,648 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.223,827,618 ක් ලැබිය යුතුව තිබුණි. | ඉදිරියට ගෙන ආ මුද්දර ගාස්තු ශේෂය පිළිබඳව ප්‍රධාන ලේකම් ගෙන් ඉල්ලීම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | මහා නගර සභා බල ප්‍රදේශය තුල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හා ආපනශාලා 30 ක් පැවති නමුත් ඉන් හෝටල් හා ආපනශාලා 22 ක් සම්බන්ධයෙන් සමීක්ෂණය සිදු කර බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | කඩිනමින් ආදායම අයකළ යුතු වේ. |
| (ඔ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍ර 3330 ක් නිකුත් කර තිබූ අතර එයින් 370 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. වරිපනම් තක්සේරු සඳහා යොමු කළ සංඛ්‍යාව 312 ක් වුවත් නව වරිපනම් තක්සේරු 247 කට පමණක් ලබා දී තිබුණි. ඒ අනුව නිකුත් කරන ලද ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍රවලට අදාළව ඉදිකිරීම් සිදු කර තිබේද යන්න පසු විපරම් කර වරිපනම් බදු අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | අනුකූලතා සහතික නිකුත් කර ඇති ගොඩනැගිලිවල වරිපනම් තක්සේරුව සඳහා ඉල්ලීම් කළ ද, එම ගොඩනැගිලි සම්පූර්ණයෙන් ඉදි කරන තෙක් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වරිපනම් තක්සේරු කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන බව. | වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**2.3 අධිභාර**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධි විධාන ප්‍රකාරව වග කිව යුතු අයවලුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයේ දී රු. 451,376 ක් වූ අධිභාර 03ක් පනවා තිබුණි. | අභියාචනා සම්බන්ධයෙන් අවසන් තීරණයක් ලැබී නොමැති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාතර මහා නගර සභාවේ ස්ථාපිත කර තිබූ ගිනි නිවන ඒකකයේ ස්ථානභාර නිලධාරියකු නොමැති වීම නිසා 2018 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට ගිනි ආරක්ෂණ සහතික නිකුත් කිරීම මේ දක්වා අත්හිටුවා ඇති අතර ඒ හේතුවෙන් සභා බල ප්‍රදේශයේ ජනතාවට ගිනි ආරක්ෂණ සහතික ලබා ගැනීමට ගාල්ල ප්‍රදේශයට යාමට සිදුවී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ගිනි ආරක්ෂණ සහතික නිකුත් කිරීමෙන් රු.250,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද එම අදායමද සභාවට ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී සුදුසු නිලධාරියෙකු පත්කොට නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආයතන කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ආ) | කොටවිල කසළ කළමනාකරණ මධ්‍යස්ථානයට අයත් භූමියෙන් අක්කර 05 ක කොටසක් හා | අක්‍රීය වී පැවති හලර් යන්ත්‍රය ද මේ වන විට සක්‍රීය කරගෙන | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා ස්ථිර |

| | | | |
|---|---|---|---|
| | කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා භාවිතා කර තිබූ ගොඩනැගිල්ලෙන් කොටසක් කසළ මගින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතියට ලබා දීම හේතු කරගෙන එක් කසළ හලර් යන්ත්‍රයක් භාවිතා කිරීමට නොහැකි වීමත් කසළ ගොනු තබා ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩ හා ධාරිතාවය නොමැතිවීමත් නිසා කොම්පෝස්ට් නිෂ්පාදනය 2015 නවතා තිබූ අතර ඉන් පසු සමාලෝචිත වර්ෂය දක්වා සියයට 88 කින් පමණ සාමාන්‍ය ප්‍රතිශතයකින් අඩුවී තිබුණි. | ඇති බවත්, කසළ මගින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිකර ඇති ගොඩනැගිල්ල ද තාවකාලිකව කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතියට ලබා ගැනීමට අපේක්ෂිත බව. | වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඇ) | කොටවිල කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ගෙන එන සම්පූර්ණ කසළ තොගයට ප්‍රමාණවත් පරිදි කොම්පෝස්ට් නිෂ්පාදන ධාරිතාවයක් පවත්වා නොගැනීම නිසා කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදා නොගැනීමෙන් ඉතිරිව පවතින කසළ වසර 08 ක පමණ කාලසීමාවක් තිස්සේ විවෘත භූමියේ ගොඩ ගැසී තිබීමෙන් විශාල කසළ කන්දක් නිර්මාණය වී තිබුණි. | කසළ මගින් විදුලිය නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉදිකර ඇති ගොඩනැගිල්ල යොදා ගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය වැඩිකර ගැනීම මගින් හා ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි නොදිරන කසළ පෞද්ගලික ආයතනයක් වෙත ලබාදීම මගින් කසළ අංගනයට බැහැර කරන කසළ ප්‍රමාණය අවම කරගැනීමට අපේක්ෂිත බව. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා ස්ථිර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |
| (ඈ) | නිර්මාණය වූ විශාල කසළ කන්ද හේතු කර ගෙන ඇති වී තිබෙන පාරිසරික හා සෞඛ්‍යමය ගැටළුකාරී තත්ත්වය පාලනය කිරීම සඳහා කෙටිකාලීන විසඳුමක් ලෙස කුලී පදනම මත එක්ස්කැවේටර් යන්ත්‍ර යොදවා පස්වලින් කසළ යට කිරීම සඳහා 2014 වර්ෂයේ මැයි මස සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු. 41,114,025 ක වියදමක් සභාවට දැරීමට සිදුවී තිබූ අතර, පස්වලින් යට කර තිබූ කසළ කඳුවල පස සෝදා යාමෙන් නැවතත් කසළ කන්ද පෙර පරිදි නිරාවරණය වී පැවති බැවින් ඒ වෙනුවෙන් දරා තිබූ මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | කසළ අංගනය වෙත යොමු කරන කසළ දෛනිකව තුනී කර පස් යොදා වැසීම, මඟින් තවදුරටත් කසළ බැහැර කිරීමට හැකිවන පරිදි එම ස්ථානය සකස් කර ගැනීම සඳහා කුලී පදනම මත ස්කැවේටර් යන්ත්‍රයක් සේවයේ යොදවා ඇති බව. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා ස්ථිර වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයට පෙර සිට 2020 වර්ෂය දක්වා කාලසීමාව තුළ ධාවනයෙන් ඉවත් කර තිබූ පොත් වටිනාකම රු.2,412,000 ක් වූ ට්‍රයිසිකල් 09 ක් හා පොත් වටිනාකම රු.428,000 ක් වූ අත් ට්‍රැක්ටර් 02 ක් අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරන බව. | ධාවනයෙන් ඉවත් කළ වාහන කඩිනමින් අපහරණය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයට පෙර සිට අක්‍රීය තත්ත්වයේ පවතින සභාව සතු ගලි රථය අලුත්වැඩියා කර ධාවනය සඳහා යෙදවීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. | තාක්ෂණික වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන බව. | අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කළ යුතු වේ. |
| (ඇ) | 2011 වර්ෂයට පෙර සිට 2012 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව ගෙවිය යුතු විගණන ගාස්තු රු.4,484,208 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් නිරවුල් කළ යුතු වේ. |
| (ඈ) | 2007 වර්ෂයත් පසුගිය වර්ෂයත් අතර කාලපරිච්ඡේදය තුළ අවශ්‍යතා සලකා බැලීමකින් තොරව මිලදී ගැනීම සිදු කිරීම නිසා විවිධ ප්‍රමාණවලට අයත් ටයර් 189 ක් හා ටියුබ් 30 ක් මාස 10ත් වර්ෂ 16 ත් අතර කාලයක සිට ගබඩාව තුළ ගබඩා කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | අවශ්‍යතාවය පිළිබඳ සලකා බලා මිලදී ගැනීම් කළ යුතු වේ. |
| (ඉ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ xi වගන්තියේ විධිවිධානවලින් බැහැරව හා රාජ්‍ය වියදම් ඉතාම අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් යොදා ගැනීමට හැකි වන පරිදි දැඩිව පාලනය කළ යුතු වකවානුවක මාතර මහා නගර සභාව විසින් ඇතැම් මුද්‍රිත ආකෘති පත්‍ර ප්‍රමාණවත් පරිදි ගබඩාවේ ගබඩා කර තිබියදී සමාලෝචිත වර්ෂයේදී මුද්‍රිත ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු. 3,312,850 ක වියදමක් දරා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | සභාව සතු එක් එක් වාහනයට අදාලව ඉන්ධන පරීක්ෂාව සිදු කළ කාලපරිච්ඡේදය තුල ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය/ යන්ත්‍ර පැය ප්‍රමාණය අනුව සැපයිය යුතු ඉන්ධන ප්‍රමාණය සැසඳීමේදී වාහන 11 කට අදාලව ඉන්ධන ලීටර් 1,358.56 ක් වැඩියෙන්ද, වාහන 03 කට අදාලව ඉන්ධන ලීටර් 864.42 ක් අඩුවෙන්ද සපයා තිබුණි. | වාහනවල ඉන්ධන තුලනය නිවැරදිව සිදුකිරීමට කටයුතු කරන බව. | නිවැරදිව සිදු කළ යුතු වේ. |
| (උ) | 2021 අප්‍රේල් 13 වන දින කසළ රැගෙන කොටවිලට බැහැර කර නැවත මාතර මහා නගර සභාව බලා පිටත්ව එන අවස්ථාවේදී ටිපර් රථය ඒ අසල නවතා තිබූ යතුරුපැදියක හා පෞද්ගලික බස් රථයක ගැටී අනතුරකට පත්ව තිබූ අතර අනතුර සිදුවී වසර 1 ½ කට පසුව සිදුකර තිබූ විමර්ශනයෙන් රියදුරු වගකිවයුතු බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රථය අලුත්වැඩියා කර හානිය ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කටයුතු මෙතෙක් අවසන් කර නොමැති බව. | හානිපූර්ණය කඩිනම් කළ යුතු වේ. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මහා නගර සභා බලප්‍රදේශයට අයත් බ්‍රවුන්ස්හිල්හි පුද්ගලයන් දෙදෙනෙකු විසින් සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව අනවසරයෙන් ගොඩනැඟිලි 02 ක් ඉදිකරමින් පැවති අතර මේ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් 2010-2030 මාතර නාගරික සංවර්ධන බලප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්මේ (IIවෙළුම) සැලසුම් හා ගොඩනැඟිලි රෙගුලාසිවල II වන හා IV වන උපලේඛන ප්‍රකාරව ගාස්තු අය කර විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සංශෝධිත සැලසුම් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2018 වර්ෂයේ දී රු.48,450,204 ක් වැය කර වැඩ අවසන් කර තිබූ වල්ගම පොදු වෙළෙඳ සංකීර්ණ ගොඩනැඟිල්ල පොදු වෙළඳපොලකට උචිත සැලැස්මකට අනුව ඉදිකර නොතිබීම නිසා එම වෙළෙඳපොලේ කඩ කාමර 02 ක්, බිම් අල්ලි 05 ක් හා මාළු ලැලි 01 ක් ලබා ගෙන තිබූ වෙළෙඳුන් විසින් වෙළෙඳ සංකීර්ණයෙන් පිටත කොටසක තාවකාලික මඩුවක් සකස් කර වෙළෙඳාම් කරමින් තිබුණි. එසේම මෙම වෙළෙඳසැලේ කඩ කාමර 13 න් කඩ කාමර 11 ක් හා බිම් අල්ලි 08 න් බිම් අල්ලි 03 ක් වෙළෙඳුන් වෙත ලබා දීමෙන් තොරව වසා දමා තිබුණි. | අදහස් දක්වා නොමැත. | සභා දේපළ ඵලදායී ලෙස භාවිතයට ගත යුතු වේ. |
| (ඇ) | 2016 මැයි 06 දින අත්සන් කරන ලද සංශෝධිත දෙවන ගිවිසුම මගින් මාතර මහා නගර සභාවට අයත් කොටවිලවත්ත ඉඩමෙන් අක්කර 05 ක භූමි ප්‍රමාණයක් වසර 25 ක කාලසීමාවක් සඳහා විදුලි ජනනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට එක්තරා පුද්ගලික සමාගමක් වෙත තාවකාලික භුක්තිය සඳහා ලබාදීමේදී මාසික බදු කුලී තක්සේරුවකට යටත්ව බදු කුලී ගිවිසුමකට එළඹ නොතිබුණි. | ව්‍යාපෘති ගිවිසුමේ කොන්දේසි කඩකිරීම සම්බන්ධව අදාල ඉදිකිරීම් සමාගමට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව | දේපළ බදු දීමේ ගිවිසුමකට ඇතුළත් විය යුතු වේ. |

## 3.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 07/03/ Rev/matara දරන හා 2001 මැයි 14 දිනැති ලිපිය ප්‍රකාරව වාණිජ සංකීර්ණය සඳහා වැය වූ මුදලින් සියයට 35 ක් එනම් රු. 37,871,539 ක මුදල කඩ කාමර ටෙන්ඩර් කර ලබාගත් පෙර ගෙවීම් මුදලින් (Key Money) එකවර ගෙවා දැමිය යුතු බව දක්වා තිබුණද වර්ෂ 20 කට අධික කාලයක් ගතවී ඇතත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාතර මහා නගර සභාවේ නගරාධිපතිට සහ සභිකයන්හට ආඥාපනත්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා අනිකුත් චක්‍රලේඛ පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට සුදුසුකම් සහිත කාර්යමණ්ඩලයක් සිටියදී අමතර උපදේශකයෙකු බඳවා ගෙන 2020 ඔක්තෝබර් සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.668,333 ක උපදේශක දීමනා ගෙවා තිබුණි. | උපදේශකවරයාගේ අධ්‍යාපන සහතික, රාජ්‍ය සේවයේ සිට විශ්‍රාම ගිය බව සනාථ කෙරෙන ලියවිලි හා සේවා සහතික ගොනුවට ලබා දී ඇති බවත්, නගරාධිපති කාර්ය මණ්ඩලය ඇඟිලි සළකුණු යන්ත්‍රය මඟින් පැමිණීම පිටවීම සනාථ කර ගැනීමක් සිදු නොකරන බවත්, මෙම උපදේශකවරයා සෑම මසකම ඉටු කරන ලද වැඩ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර ඇති බව. | අවශ්‍ය උපදෙස් නාගරික කොමසාරිස් විසින් විධිමත්ව ලබාගත යුතුය. |
| (ඇ) | සභාව සතු ඉන්ධන පිරවුම්හල සඳහා 2021 මාර්තු 03 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් වරකට ලීටර් 6,600 බැගින් අවස්ථා 25 ක දී ඩීසල් ලීටර් 165000 ක් රු.33,978,861 ක මුදලක් ගෙවා මිලදී ගෙන තිබූ අතර ඒ සඳහා රු. 446,851 ක අමතර ප්‍රවාහන ගාස්තුද සභා අරමුදලින් ගෙවා තිබුණි. එහෙත් සභාව විසින් වට්ටමක් ලබා ගැනීමට හා නොමිලේ ඉන්ධන ප්‍රවාහනය කර ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ඉල්ලීමක් යොමු කර ඇති බව. | පිරිවැය අවම වන පරිදි මිලදී ගැනීම් කළ යුතු වේ. |
| (ඈ) | 2017 නොවැම්බර් 07 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1:3:1 හා 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 (vii) ඡේදවල විධිවිධානවලින් බැහැරව මාතර මහා නගර සභාව සතු කෘ කැබ් රථය කණ්ඩායම් ප්‍රවාහනයට නියමිත කිලෝමීටර් 50 ඉක්මවා කිලෝමීටර් 27 ක් දෛනිකව කාර්යාලයට යාමට ඒමට නාගරික ඉංජිනේරු වෙත ලබා දී ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 01 දින සිට රියදුරෙකු බඳවා ගෙන තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ 40 (1) (අ) (ආ) සහ (ඇ) වගන්ති මඟින් පැවරී ඇති බලතල හා අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන මගින් නිශේධනය නොවන බැවින් අවශ්‍යතාවය පරිදි ඉහත බඳවා ගැනීම සිදු කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු කොටුවේගොඩ කඩකාමර 56 වෙළඳ සංකීර්ණයට යාබද දකුණු පසින් පිහිටි අඩි 20.5 x අඩි 22 ප්‍රමාණයේ සභාව සතු හිස් ඉඩම වැට මායිම් යොදා මහා නගර සභාව සතු ඉඩමක් ලෙස දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කර නොතිබූ අතර වම් පසින් පිහිටි ඉඩමෙහි මාතර මහා නගර සභාවෙහි අනුමැතියකින් තොරව එක්තරා ආයතනයක් විසින් අඩි 22 ක් දිගට හා අඩි 11 ක් පළලට කැටගල් අතුරා ප්‍රවේශ මාර්ගයක් සකස් කර තිබුණි. | නැවත මැනීම් සිදුකර වැට මායිම් යොදා නිරවුල් කර පෞද්ගලික භාවිතය නැවැත්වීම සඳහා ඉදිරි කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.6 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතර මහා නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන ටොන් 35 ක් පමණ වූ කසළ කළමනාකරණය කිරීම සඳහා දිගුකාලීන විසඳුමක් ලෙස කසළ මගින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය (Waste to Energy Project) මාතර මහා නගර සභාව, මධ්‍යම පරිසර අධිකාරිය හා එක්තරා පුද්ගලික සමාගමක් අතර 2014 අගෝස්තු 08 දින ඇති කර ගන්නා ලද ත්‍රෛපාර්ශවික ගිවිසුමක් මත 2014 අගෝස්තු 11 දින ආරම්භ කර තිබුණි. ව්‍යාපෘතිය පවත්වාගෙන යාම සඳහා මාතර මහා නගර සභාවට අයත් කොටවිලවත්ත ඉඩමෙන් අක්කර 05 ක භූමි ප්‍රමාණයක් වසර 25 ක කාලසීමාවක් සඳහා ලබා දී තිබුණි. ගතවූ වසර 08 ක කාලසීමාව තුල අවස්ථා 07 කදී ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු විටින් විට නවතා දමා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉදිකිරීම නතර කර තිබුණි. | ව්‍යාපෘතියට අදාලව ඇතිකර ගනු ලැබූ ත්‍රෛපාර්ශ්වික ගිවිසුමේ කොන්දේසි කඩකිරීම මත අදාල සමාගමට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2:1 , 4:2:2 හා 4:2:3 මාර්ගෝපදේශයන්ට අනුකූල වන පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩ සටහන් යටතේ ප්‍රසම්පාදන රැස්වීම් 165 ක් පවත්වා රු.40,850,096 ක් වටිනා ප්‍රසම්පාදන තීරණ ගෙන තිබුණද 2006 මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:11:3 ප්‍රකාරව රැස්වීම් වාර්තා ගොනුවක් හෝ පොතක් අනුක්‍රමික අංක යොදා පවත්වා ගෙන ගොස් නොතිබුණි. | නිවැරදි කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය වර්ෂයේ විවිධ අරමුදල් යටතේ මාර්ග දෙකක කාණු පද්ධති ඉදිකිරීමේදී භාවිතා කරන ලද කම්බි ප්‍රමාණයට වඩා කම්බි කිලෝ 71.17 කට රු.23,356 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ඉටු කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කර්මාන්ත වැඩ ඉටුකිරීමේදී පදම් කළ ලෑලි (Plywood) පුවරු භාවිතා කිරීමෙන් කාණු හැඩයම් කිරීමට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රේටයක් හඳුන්වා දී නොතිබූ අතර ඒ සඳහා සුදුසු රේටයක් වන දකුණු පළාත් ඉංජිනේරු කාර්යාලය විසින් Ct -036 යටතේ හඳුන්වා දුන් රේටය භාවිතා නොකර ST -057 හා ST – 112 යොදා ගැනීම නිසා සභාව විසින් ඉටුකළ කොන්ක්‍රීට් කාණු 03 ක හැඩයම් සකස් කිරීමේදී රු.290,728 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | සුදුසු හා වාසිදායක රේටයන් භාවිතා කළ යුතු වේ. |
| (ඇ) | පසුගිය වර්ෂයේ ග්‍රාමීය හා අවශේෂ යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ග්රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රු.785,349 ක නිමි වැඩ වටිනාකමක් සහිතව කුට්ටිගල් අතුරා සංවර්ධනය කර තිබූ මාර්ග 02 ක් ඉතා සීමිත ප්‍රතිලාභීන් පිරිසක් ඉලක්ක කරගෙන ක්‍රියාත්මක කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | වැඩිප්‍රතිලාභීන් පිරිසකට ප්‍රතිලාභ සැලසෙන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කළයුතුය. |
| (ඇ) | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ සහ බලප්‍රදේශය තුල ක්‍රියාත්මක කර තිබූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 15 ක මාර්ග දෙපස රුක් රෝපණය කිරීම වැඩ අයිතමය ඉටු කර නොතිබූ නමුත් ඒ වෙනුවෙන් එක් එක් කර්මාන්තය සඳහා රු. 10,000 බැගින් රු. 150,000 ක මුදලක් කර්මාන්ත ගෙවීම් බිල්පත්වලට ඇතුළත් කර තිබුණි. | මුදල් ගෙවා නොමැති ව්‍යාපෘති 03 ක බිල්පත් වලින් මුදල් අඩුකර ගැනීමට කටයුතු කරන බවත්, ඉතිරි ව්‍යාපෘතිවල රුඳවුම් මුදලින් අඩුකර ගැනීමට කටයුතු කරන බව. | ඉටු කළ වැඩ කොටස් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වේ. |
| (ඉ) | එක්තරා ටෙලිකොම් සමාගමක් විසින් සභාව සතු මැද්දවත්ත එළියකන්ද බුවුන්ස්හීල්හි පිහිටි සරත් සේදර මාවත කේබල් එලීම සඳහා පලුදු කර තිබූ අතර අදාල සමාගමෙන් පසුගිය වර්ෂයේ දෙසැම්බර් 20 දින රු.3,081,668 ක් සභාවට අයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මාර්ගය අලුත්වැඩියා කටයුතු සිදුකර නොතිබුණි. | මාර්ගය පිළිසකර කිරීමට අදාළ ඇස්තමේන්තුවක් සකසා මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇති බවත්, අනුමැතිය ලැබුණු පසු මාර්ගය අළුත්වැඩියා කිරීමට බලාපොරොත්තු වන බව. | කඩිනමින් මාර්ග අලුත්වැඩියා කටයුතු සිදු කළයුතුය. |
| (ඊ) | සෘජු ශ්‍රම පදනම මත ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 06 ක් පිළිබඳව සිදු කළ නියැදි විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ලබා ගත් නිමි වැඩවල මැනුම් අනුව භාවිතා කළ යුතු ද්‍රව්‍ය ප්‍රමාණයන් හා ඒ ඒ කර්මාන්ත සඳහා ගබඩාවෙන් නිකුත් කර තිබූ ද්‍රව්‍ය ප්‍රමාණය අතර වෙනස්කම් නිරීක්ෂණය වූ අතර ඒ අනුව සෘජු ශ්‍රම පදනම මත ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත 06 සඳහා රු.334,880 ක් වටිනා ද්‍රව්‍ය වැඩිපුර නිකුත් කර තිබුණි. | මාර්ගයේ පවතින අවිධිමත් ස්වභාවය මත අමුද්‍රව්‍ය වැඩිපුර වැයවී ඇති බව. | නිසි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 වර්ෂයේ සභා අරමුදල් මත ක්‍රියාත්මක කරන ලද ඉසදින් නගරයේ සේවා පියසෙහි ඉතිරි කොටස සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ තාක්ෂණ නිලධාරිණිය විසින් රු.432,448 ක වටිනාකමින් යුතු නිමි වැඩ වාර්තාවට අදාලව පිළියෙල කර තිබූ බිල් පතෙහි වැඩ විෂය අංක 01 යටතේ ආනයනික දැව භාවිතා නොකර සිවිලිම් සවි කිරීමට දැව රාමුව ඉදිකර ඒ සඳහා රු.425,149 ක මුදලක් ගෙවීම් නිර්දේශ කර කොන්ත්‍රාත්කාර සමිතියට ගෙවා තිබුණි. මෙසේ ව්‍යාජ බිල්පත් නිර්දේශ කර ගෙවීම් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙන නොතිබුණි. | දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් මෙම චෝදනාවට අදාලව විනය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති බවත්, විමර්ශන නිලධාරීන් පැමිණ සාක්ෂි හා ප්‍රකාශ ලබා ගැනීම සිදුකර ඇති බව. | කඩිනමින් විනය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී වල්ගම පොදු වෙළෙඳපොළ ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා රු.25,000 ක් වැය කර මිලදී ගෙන තිබූ සිමෙන්ති බ්ලොක් ගල් 250ක් නිසි ප්‍රමිතියෙන් තොර වූ අතර රසායනාගාර පරීක්ෂණ වාර්තාවට අනුව සිමෙන්ති බ්ලොක්ගල්වල ශක්තිය වර්ග මිලිමීටරයකට නිව්ටන් 1.1 ත් 1.3 ත් අතර විය. | අදහස් දක්වා නොමැත. | නිසි ප්‍රමිතියෙන් යුතුව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වේ. |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------------------- | ----------- |
| (අ) | සභාවේ සේවය කර විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.852,243 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විට අය නොවී පැවතුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | කඩිනමින් අය කර ගත යුතු වේ. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 10.2 වගන්තිය ප්‍රකාරව ආපදා ණය ගෙවීම සඳහා සුදුසුකම් ලබනුයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි නිලධරයෙකු වුවත්, මාතර මහා නගර සභාව විසින් අනියම් හා ආදේශක කම්කරුවන් 16 දෙනෙකුට එකතුව රු.1,062,717 ක් වූ ආපදා ණය ගෙවා තිබුණි. | ආපදා ණය ලබාදීමේදී අධ්‍යාපන සහතිකවල ගැටළු පැවති සේවකයින් හට රු.150,000 ක් පමණක් ගෙවීම් කර ඇති බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |